www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගෝලීය තෙල් මිල ගනන් නැගීමට සමාජවාදී පිලිතුරක්

## A socialist answer to the global rise in gas prices

**කර්තෘ මන්ඩලය විසිනි**
**2008 ජූලි 05**

මෑත මාසවල තෙල් මිලෙහි තියුනු නැඟීම, එක්සත් ජනපදයේත් ජාත්‍යන්තරවත් වැඩ කරන ජනතාවන් මත දැවැන්ත බරක් පටවා ඇත. එක්සත් ජනපදයේ ඉන්ධන පිරවුම් හලක තෙල් ගැලුමක මිල ඩොලර් 4 සිට මෙම ග්‍රීෂ්ම ඍතුවේදී ඩොලර් 5 ක් හෝ ඊටත් වඩා ඉහල යා හැකිය. දැනටමත් ආහාර, නිවාස, සෞඛ්‍ය හා අනෙකුත් වියදම්වල බරෙන් මිරිකී සිටින කම්කරු පවුල් සිය ජීවන තත්වයන් තියුනු ලෙස කපාහැරීමේ තත්වයකට මුහුනපා සිටිති.

ඇමරිකානු නාගරික ප්‍රදේශවල විසිරීයන ස්වභාවය නිසා නිවසේ සිට දුරගෙවා වැඩට යාමට සිදුවීම හා විකල්ප මඟී ප්‍රවාහන කටයුතුවල ආයෝජනයේ හිඟකමෙන්, එක්සත් ජනපදයේ වැඩකරන ජනතාව සංවර්ධිත රටවල තම සගයන්ට වඩා සිය මෝටර් රථ මත රඳා සිටිති. මෙයින් ජනතාව තෙල් මිල ඉහලයාමට වඩාත් නිරාවරනය වෙති. පෙර වසරේ ජූලි මාසයේ පටන් මේ දක්වා මිල සියයට 38 කින් ඉහල ගොස් ඇත.

ඇසෝසියේටඩ් පුවත් හා යාහූ පුවත් සේවයන් එක්ව කල සමීක්ෂනයකට අනුව තොරතරු සැපයූ පුද්ගලයන් 10 කින් 9 දෙනෙක් නඟින ඉන්ධන මිල නිසා ඉදිරි සය මාසයේදී මූල්‍යමය වශයෙන් තමන් මිරිකී යනු ඇතැයි අපේක්ෂා කරති. අඩක් පමන කියා ඇත්තේ එමඟින් බරපතල අග හිඟකම් ඇතිවිය හැකි බවයි. ස්වාභාවික ඉන්ධන පදනම් කර ගත් පොහොර හා ප්‍රවාහන වියදම් වැඩිවීම ආහාර මිල තියුනු ලෙස ඉහල යෑමට දායක වෙයි. ඩීසල් මිල පුද්ගලික ට්‍රක් රථ රියදුරන් බංකොලොත් කරන අතර මෝටර් රථ හා ගුවන් ප්‍රවාහන ක්‍රමාන්තය නඟින ඉන්ධන මිල කරන කොට ගෙන තොග පිටින් ශ්‍රමිකයන් දොට්ට දමති.

එකසත් ජනපදයේ තත්වය ලෝක සංසිද්ධියක කොටසකි. නඟින ඉන්ධන පිරිවැය නිසා විනාශයට මුහුනපා සිටින ට්‍රක් රථ රියදුරන්, ගොවීන් හා ධීවරයන්ගේ විරෝධතාවන් ස්පාඤ්ඤය, ප්‍රන්සය, ඉතාලිය, බ්‍රිතාන්‍ය හා අනෙකුත් යුරෝපීය රටවල් පුරා පැතිර යයි. හොංකොං, ඉන්දියාව, නේපාලය, ඉන්දුනීසියාව හා දකුනු කොරියාවේ වැඩ වර්ජන හා පෙලපාලි ද, ආසියාව පුරා කෝපය ද දැල්වෙමින් තිබේ.

තෙල් මිලෙහි වත්මන් නැඟීමට දායක වන සාධක බොහෝය. 2003 වසරේදී ඩොලර් 25 ක්ව පැවති තෙල් බැරලයක් අද වන විට ඩොලර් 140 ඉක්මවා ඇත. පසුගිය වසරේ පමනක් එය දෙගුනයකටත් වඩා වැඩි විය. එක් ප්‍රමුඛ සාධකයක් වන්නේ එකසත් ජනපද ඩොලරයේ අගය බාල්දු වීමයි. තෙල් මිල ඩොලරයට ගැටගැසී අති නිසා එහි අගය පහත වැටීමෙන් තමන්ට අහිමිවන ආදායමට හිලව් වශයෙන් තෙල් නිපදවන රටවලට මිල ඉහල දැමීමට සිදුවෙයි. ඉරාක හා ඇෆ්ගනිස්ථාන යුද්ධ හා වාඩිලෑම්ද, ඉරානයට එරෙහි එක්සත් ජනපදයේ වැඩෙන තර්ජනද, මැද පෙරදිග, අප්‍රිකාව, රුසියාව හා අනෙකුත් තෙල් නිපදවන කලාපවල හූ දේශපාලනික ආතතීන් ද, සැපයුමේ හදිසි කඩාවැටීම් පිලිබඳ භීතිය අවලුවාලයි. මේ සියල්ලට ඉහලින් ඇත්තේ ලෝක පෙට්‍රෝලියම් සංචිත සිඳී යාමෙන් විශේෂයෙන්ම චීනයේ හා ඉන්දියාවේ වේගයෙන් නැඟීඑන ආර්ථිකයන්ගෙන්, එන ගෝලීය ඉල්ලුම සපුරාලිය නොහැකිය යන වැඩෙන පිලිගැනීමයි.

අර්බුදයේ හදවතෙහිම ඇත්තේ ගෝලීය ආර්ථික පද්ධතියේ බිඳ වැටීමයි. දශක ගනනාවක් තිස්සේ දේශපාලඥයන් ද, ව්‍යාපාර හා මාධ්‍ය ලොක්කන් ද ලෝක ජනතාව සිය ස්වාර්ථකාමී කියාපෑමට එනම් සමාජයේ සම්පත් භාවිතා කලහැකි වඩාත්ම තාර්කික මාධ්‍ය වනාහි ධනේශ්වර වෙලඳපොලය යන්නට බැඳ තබාගත්හ. එහෙත් දැන් එලිමහනට පැමින ඇත්තේ නූතන ජන සමාජයේ ඕනෑ එපාකම් හා ලාභ පද්ධතියේ අරාජකත්වය අතර මූලික ගැටුමයි.

තම “ව්‍යාපාරික රහස්” ජනතාවගෙන් වසංකිරීමේ මුල් බැසගත් අවශ්‍යතාවන් ඇති තෙල් නිපදවන රටවල් හා බලශක්ති සංගතයන් හේතුකොට ගෙන අවශේෂ ගෝලීය තෙල් සැපයුම පිලිබඳ කිසිදු අව්‍යාජ තක්සේරුවකට එලඹීමට නොහැකිවී ඇත. සමහර කරුනු සම්බන්ධයෙන් දශක ගනනාවක් තිස්සේ අවශ්‍ය තාක්ෂනය තිබියදීත් විශාල පරිමානයේ පරිසර හිතකාමී හා තිරසාර විකල්ප ගොඩනැඟීම, ඇටුවන් බැහැපු ව්‍යාපාර හා දේශපාලන විරුද්ධත්වය නිසා ඇනහිට තිබේ.

ධනේශ්වර පද්ධතියේ රාමුව තුල ගොඩනඟා ඇති ඊනියා විසඳුම්, අර්බුදය ඔද්දල් කර ඇතුවා පමනි.

ජීව ඉන්ධන පිලිබඳ සංවර්ධන වැඩසටහන ඉන් එකකි. ජීව ඉන්ධන, කාබන් මුදාහැරීම අවමකිරීමේ මාධ්‍යයක් බවට පුලුල් වශයෙන් විවාදයට තුඩුදුන් ප්‍රකාශ යමෙක් පිලිගත්ත ද, ඒවායේ නිෂ්පාදනය තුඩුදී ඇත්තේ ලොව පුරා විනාශය කටින බඩඉරිඟු හා අනෙකුත් බෝග මිල දැවැන්ත ලෙස ඉහල දැමීමට පමනි. සමස්ත ව්‍යාපෘතියම ගැටගසා ඇත්තේ ඒඩීඑම් හා කාගිල් වැනි කෘෂි ව්‍යාපාරයේ ඒකාධිකාරයන්ගේ අවශ්‍යතාවන්ටය. ඒවායේ මුලුමහත් උත්සුකය පවතින්නේ පෘතුවි ගෝලය උනුසුම්වීම පාලනය කිරීමට නොව සිය ලාභ පොදි තර කර ගැනීම කෙරෙහිය.

ඉතිරිව ඇති පෙට්‍රෝලියම් සංචිත බුද්ධිමත් ලෙස ප්‍රයෝජනයට ගැනීමට හා අව්‍යාජ විකල්පයන් වර්ධනය කිරීමට, පෙර නොවූ විරූ මට්ටමේ ජාත්‍යන්තර සහයෝගයක් හා ලෝකයේ තාක්ෂනික, ද්‍රව්‍යමය හා මානව සම්පත් පරිපාලනයක් අවශ්‍ය කෙරේ. එකිනෙකා පරයා වාසි ලැබීම සඳහා ධනවාදය විසින් පෘතුවි ගෝලය තරගකාරී ජාතික රාජ්‍යයන්වලට බෙදාතිබෙන තාක් දුරට මෙය කල හැක්කක් නොවේ.

ලෝකයේ ඉතිරිව ඇති තෙල් සම්පත් පාලනය සඳහා සිදුවන උමතු පොරය තුඩුදී ඇත්තේ ප්‍රචන්ඩ අරගලයකටය. එක්සත් ජනපදයේ ලේ වැකි ඉරාක ආක්‍රමනය හා වාඩිලෑම ඉන් එක් සිදුවීමක් පමනි. එක්සත් ජනපදයේ සිට චීනය, රුසියාව, යුරෝපය, හා ජපානය යන සියලු ප්‍රධාන බලවතුන් මැද පෙරදිග, කැස්පියන් කලාපය, උත්තර ධ්‍රැවය හා දක්ෂින ධ්‍රැවය මෙන්ම ලෝකයේ සාගර හා මුහුදු වෙරලවල පවා පාලනය සඳහා තරග වැදී සිටිති. සම්පත් සඳහාවූ මෙම තරගය මානව වර්ගයාගේ ම පැවැත්මට තර්ජනය කරන අධිරාජ්‍යවාදී යුද්ධයන්ගේ නව වටයක් පැනනැඟීමේ අන්තරාය ලොව හමුවේ තබා ඇත.

## මූල්‍ය සමපේක්ෂනය

ගෝලීය තෙල් මිලගනන් ඉහල යාමේ තවත් ප්‍රධාන අංශයක් නම් නිව් යෝර්ක් වානිජ්‍ය හුවමාරුවේ හා අනෙකුත් භාන්ඩ වෙලඳපොලවල හටගෙන ඇති සමපේක්ෂන උන්මාදයයි.

කඩාවැටෙන ඩොලරය, ඩොට්කොම් කොටස් වෙලඳපොල බුබුල මෙන්ම අවමුඛ උකස්කර හා නිවාස බුබුල පුපුරායාම යනාදි වශයෙන් පසුගිය පස් වසර තුල වර්ධනය වූ ගෝලීය මූල්‍ය අස්ථාවරත්වය ධනවත් ආයෝජකයන්ගේ මුදල්, භාන්ඩ වෙලඳපොල වෙත යොමු කරවීය. එහිදී ඔවුහු තෙල්, බඩඉරිඟු හා රත්රන්වල අනාගත ගිවිසුම් (මෙඑමරී - එකගවූ අනාගත මිල ගනන් මත සැපයීම සඳහා ඇතිකර ගන්නා) මිලට ගැනීමේ හා විකිනීමේ නිරතවූ අතර නොකඩවා ඉහල යන මිලගනන් මත ඔට්ටු තැබූහ.

එක්සත් ජනපදයේ අනාගත භාන්ඩ වෙලඳ කොමිසමේ ( සීඑෆ්ටීසී ) ලිහිල් රෙගුලාසි යටතේ ආයෝජකයෝ, පසුගිය පස් වසර තුල සිය අනාගත භාන්ඩ ගිවිසුම් මිලට ගැනීම විසි ගුනයකින් ඉහල නැංවූහ. ඒ 2003 දී ඩොලර් බිලියන 13 සිට 2008 දී බිලියන 290 දක්වාය. මෙම සමපේක්ෂනාත්මක ගලායාම් දැන් තවත් බුබුලක් නිර්මානය කර තිබේ. ඉහත කී වකවානුව තුල මුදුනේම ඇති භාන්ඩ වර්ග 25 මිල ගනන් සියයට 200 කින් ඉහල ගියේය.

බොහෝ අවස්ථාවල දී සමපේක්ෂකයෝ තමන් මිලට ගත් තෙල් තොග බෙදා නොහැරියහ. ඉතා සුලු මුදලක් යෙදවීමෙන් පසු ඔවුන් එලඹුනු සූක්ෂම වෙලඳ ගිවිසුම් මඟින් ඇතිකල බලපෑම මත මිල ගනන් ඉහල පිනූ අතර ආරක්ෂිත අරමුදල්, ආයතනික ආයෝජකයෝ හා තවත් අය දැවැන්ත ප්‍රතිලාභ පොදිගසා ගත්හ. සමහර ගනන් බැලීම්වලට අනුව සමපේක්ෂනයෙන් තෙල් බැරලයක වත්මන් මිල ඩොලර් 50 කින් තරම් ඉහල ගොස් තිබේ.

එවන් ලාභ ගැරීමකට බුෂ් පරිපාලනයේ සහයෝගය ඇගවුම් කරමින් එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් ජූනි 10 වන දින සීඑන්එන් වෙත ප්‍රකාශ කලේ "මිලෙහි මෙම හැසිරීමට සැලකිය යුතු කිසිදු අයුරකින් මූල්‍ය ආයෝජකයන් වගකිව යුතුයයි මම විශ්වාස නොකරමි. මේ වනාහි ඉල්ලුම හා සැපයුමයි." යනුවෙනි.

එවන් ප්‍රකාශවලින් සලකුනු කරන්නේ ඇමරිකානු දේශපාලන පද්ධතිය මූල්‍ය ප්‍රභූත්වය කෙරෙහි කෙතරම් නම් ගැතිද යන්නය. ධනේශ්වර වෙලඳපොල, ආර්ථික සම්බන්ධතාවන්ගේ අපක්ෂපාතී විනිශ්චයකරුවෙකු නොවේ. එය බලගතු ව්‍යාපාරික හා මූල්‍ය නියෝජිතයන් තමන්ගේ ලාභාවශ්‍යතාවන් වෙනුවෙන් ගසාකනු ලබන හා ලැබිය හැකි දෙයකි.

පසුගිය වසරේදී බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගම (බීපී ) තෙල් වෙලඳපොල පිස්සු වැට්ටවීම සඳහා මිල හැසිරවීමට කුමන්ත්‍රනය කිරීම සම්බන්ධව, එක්සත් ජනපද අධිකරන දෙපාර්තමේන්තුවේ පරීක්ෂනය අත්හිටුවීමට ඩොලර් මිලියන 373 ක් ගෙවීමට එකඟ විය. කැලිෆෝනියාවේ විටින් විට විදුලිය විසන්ධි කිරීමේ ප්‍රකෝපකාරී හා සිතාමතා සිදුකල ක්‍රියා ද ඇතුලත් එන්රොන් සමාගමේ විදුලිය සැපයුම ගසාකෑම කුප්‍රකටය.

තෙල් බුබුල පිලිබඳ කාරනයේදී ආරක්ෂිත අරමුදල් හා ගෝල්ඩ්මන් සැක්ස්, මෝර්ගන් ස්ටැන්ලි හා ජේපී මොර්ගන් වැනි මූල්‍යායතන සිය ආයෝජනයන් මත සියයට 200 ක ප්‍රතිලාභ අත්කර ගත්තේය. ඉන්ධන වෙලඳමේ නියුතු සිටාඩෙල් ඉන්වෙස්ට්මන්ට් සාමුහිකයේ ප්‍රධානී කෙනත් ග්‍රිෆින් 2007 වසරේදී

ඩොලර් බිලියන 1.5 ක් ද, සැක් කැපිටල් ඇඩ්වයිසර්ස් හි ස්ටීවන් කොහෙන් මිලියන 900 ක්ද උපයා ගත්හ.

ඊට අමතරව තෙල් මිල ඉහල නැගීමෙන් එක්සන්මොබිල් , චෙව්රන් , ඇතුලු මහා තෙල් සමාගම් පහ ඉමහත් වාසි අත්කර ගත්හ. මේ වසරේ මුල් කාර්තුව තුල පමනක් ඔවුන් ලත් ලාභය ඩොලර් බිලියන 36 ක් වන අතර සමාගම් විධායකයන්ට මිලියන ගනන් වැටුප් පොදි හිමිවිය.

දේශපාලන පක්ෂවලින් කිසිදු සහනයක් නොලැබෙයි.

වැඩ කරන ජනතාව මුහුනපාන අන් සියලු සමාජ ගැටලුවල දී මෙන්ම - නිවාස වෙන්දේසි කිරීමේ පටන් මහා පරිමානයෙන් රැකියා අහිමිවීම්, සමාජ අසමානතාවයේ වැඩීයාම හා යුද්ධයේ අන්තරාය - පිම්මලින් ඉහල නගින තෙල් මිලට ද, ලොව පුරාම ධනපති දේශපාලන පක්ෂ, ඔවුන් කොන්සවේටිව්, කම්කරු, හරිත හෝ සමාජවාදීන් ලෙස තමන් හඳුන්වා ගත්තද, කිසිදු විසඳුමක් ඉදිරිපත් කිරීමට අසමත්ය. ඒ වෙනුවට ලෝක ධනේශ්වර පද්ධතියේ අර්බුදය වෙනුවෙන් වන්දි ගෙවීමට වැඩකරන ජනතාව සිය පටි තදකරගත යුතු බවට ඔවුන් සියලු දෙනාම එකඟ වෙයි.

එක්සත් ජනපදයේදී රිපබ්ලිකන් හෝ ඩිමොක්‍රටික් ජනාධිපති අපේක්ෂකයන් දෙදෙනාගෙන් කිසිවෙකුත් සතුව විසඳුමක් ඇත්තේ නැත. ජෝන් මැකේන් කියා ඇත්තේ විදුලිබල මෝටර් රථයක් සැලසුම් කිරීම සඳහා ඩොලර් මිලියන 300 ක ත්‍යාගයක් පිරිනැමීම, ග්‍රීෂ්ම මාස සඳහා ශත 16 ක ෆෙඩරල් බද්ද අත්හිටුවීම, හා ඇත දියඹේ තෙල් සෑරීම සඳහා පනවා ඇති පරිසර සීමා ඉවත් කිරීම කල යුතු බවය.

මැකේන්ගේ ප්‍රචාරක කටයුතු සම සභාපති, හිටපු ටෙක්සාස් සෙනේට් සභික ෆිල් ග්‍රෑම් ද ඇතුලු ඉහල උපදේශකයන්, වර්තමාන සමපේක්ෂනයේ පුපුරා යාමට මඟ පෑදූ හා එන්රොන් සමාගම විසින් ක්‍රියාවට නැගූ , ඉන්ධන වෙලඳම සී සී කඩ කිරීමට වගකිව යුතුය.

තෙල් සමාගම්වල හා සමපේක්ෂකයන්ගේ ජනතාවාදී විරුද්ධවාදියෙකු ලෙස වෙස් ගැනීමට තැත් කරන බරක් ඔබාමා, ඉල්ලා ඇත්තේ තෙල් සමාගම්වල ලාභ වාසනාවෙන් බදු ගෙවන ලෙසත්, ඊනියා " එන්රොන් සිදුර" වසා දමන ලෙසත්ය. මෙයින් කිසිවක් සිදු නොවනු ඇත. කෙසේ වුවද, ඩිමොක්‍රටිකයන්ගෙන් විශාල කොටසක්, විශේෂයෙන්ම තෙල් ඇති ප්‍රාන්තවල, තෙල් සංගතවලින් කුමන හෝ බද්දක් අයකිරීමට විරුද්ධ වෙති. ජනාධිපතිවරනයට යොදාඇති සිය මුදලින් වැඩි පංගුව ඔබාමාට ඔට්ටු අල්ලා ඇති වෝල් වීදිය, සමපේක්ෂනයට විරුද්ධ කුමන හෝ බැරෑරුම් නීතියකට විරුද්ධ වෙති.

ඔබාමාට ද ජීව ඉන්ධන කර්මාන්තය සමඟ සමීප සබඳකම් ඇත. ඔහුගේ ප්‍රමුඛ උපදේශකයන් අතරට ඇමරිකානු පෙට්‍රෝලියම් ආයතනයේ හිටපු හිතවතුන් හා මූල්‍ය වෙලඳපොලවල් සී සී කඩ යැවීමේදී ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල ක්ලින්ටන් පරිපාලනයේ හිටපු නිලධාරීන් ද ගැනේ. ව්‍යාපාරික හා මූල්‍ය ක්ෂේත්‍රයේ ඔහුට මුදල් පොම්පකරන්නවුන්ගේ හොඳහිත දිනාගැනීම සඳහා ඔබාමා, ඔවුන්ගේ ලාභාපේක්ෂාවන්ට හානිකර කිසිදු පියවරක් නොගන්නා බව යලි යලිත් අවධාරනය කර ඇත. ඩිමෙක්‍රටික් අපේක්ෂකයාගේ වෙබ් අඩවිය ප්‍රකාශ කරන්නේ "තෙල් සමාගම්වලට හා කොටස් හිමියන්ට, කාර්යක්ෂම හා නව්‍ය ව්‍යාපෘතීන්හි ආයෝජනය කල හැකි, හොඳින් කලමනාකරනය කල ව්‍යාපාරයන් පවත්වා ගෙන යෑම වෙනුවෙන් හොඳ දිරිගැන්වීම් ලැබිය යුතුය යන්න බරක් ඔබාමා විසින් හඳුනාගෙන තිබීම තීරනාත්මකය." යනුවෙනි.

නවමු භාවය හා කර්යක්ෂමතාවය ඇතිකිරීම කෙසේ වෙතත්, ලාභ පද්ධතිය දැන් තර්ජනය කරන්නේ පෘතුවි ගෝලය පුරා කෝටි සංඛ්‍යාත ජනතාවන් සාගින්නට හා මන්ද පෝෂනයටත් නොදැරිය හැකි තෙල් උද්ධමනයකටත් ඇද දැමීමටය. කම්කරුවන් ධනේශ්වර ක්‍රමයේ අර්බුදයට වග නොකියනවාක් මෙන්ම ඒ වෙනුවෙන් වන්දි ගෙවීමට ද බැඳී නැත.

වැඩ කරන ජනතාවන්ගේ ජීවන තත්වයන් සුරැකීම සඳහා ක්ෂනික පියවර ගත යුතුය. එයට කම්කරු වැටුපේ ක්‍රය ශක්තිය අරක්ෂා කල හැකි පරිදි එහා මෙහා කරන වැටුප් පරිමානයක් හඳුන්වාදිය යුතු අතර එමගින් මිල වැඩිවීමට සමානුපාතිකව හිලව් වන ස්වයංක්‍රීය වැටුප් වැඩිවීම් ඇතුලත් විය යුතුය.

දශක ගනනාවකට පෙර එක්සත් මෝටර් රථ කම්කරු සංගමය වැනි සමිති සටන්කර ජීවන වියදම් සංශෝධන දිනාගත්හ. එමගින් ජීවන වියදම ඉහල නැගීමට සමානුපාතිකව වැටුප ද ඉබේම ඉහල ගියේය. වෘත්තීය සමිති කලකට පෙරම එවන් ඉල්ලීම් අතහැර දැමූ අතර අද ඉල්ලා සිටින්නේ කම්කරුවන් සංගතවල ලාභදායකත්වය අරක්ෂාකිරීම සඳහා දැවැන්ත වැටුප් කප්පාදු පිලිගත යුතු බවය. ධනේශ්වර පක්ෂ සමඟ එක්ව ඔවුන් අවධාරනය කරන්නේ, කම්කරුවන් සිය පටි තදකරගෙන වැඩිවන මිල ගනන්වලට අනුකූලව හැඩගැසෙමින් සිය ජීවන වියදම් කප්පාදුව ස්ථාවර යයි පිලිගත යුතු බවය.

සමාජවාදී සමානතා පක්ෂය එහා මෙහා වන වැටුප් පරිමානයක් හා ඉන්ධන වියදමට සහන සලසන අනෙකුත් හදිසි පියවර සඳහා කැඳවුම් කරයි. එයට පහත සඳහන් දේ ද ඇතුලත්ය.

៖ ඉන්ධන සංගතයන් හා සමපේක්ෂකයන්ගේ කටයුතු හා සමාජය කොල්ලකෑමට අනුබල දුන් රාජ්‍ය ආයතන පිලිබඳ පරීක්ෂන දියත් කිරීම.

៖ පාරිභෝගික භාන්ඩවල ආයෝජනය කරමින් අයථා ලෙස වාසි ලැබූවන් හා සංගත විධායකයන්ගේ තැන්පතු අත්පත් කරගෙන ජනතාවට සහන සැලසීම සඳහා ඒවා මහජන පාලනය යටතේ පවතින අරමුදලකට බැරකල යුතුය.

මෙම ක්ෂනික පියවර සඳහා සටන් කර ඒවා දිනාගත හැක්කේ ලාභ පද්ධතියට එරෙහිව කම්කරු පන්තියේ මහජන දේශපාලන ව්‍යාපාරයක් මතුවීම තුලින් පමනි.

කෙසේ වෙතත් ඒ ප්‍රථම පියවර පමනි. අවශ්‍ය වන්නේ, එක්සත් ජනපදයේත් ලෝකය පුරාත් ඉන්ධන කර්මාන්තයේ හා මූල්‍ය පද්ධතියේ මූලික ප්‍රති සංවිධානයකි.

එක්සොන්මොබිල්, ෂෙව්රොන්, කොන්කොෆිලිප්ස්, බ්‍රිටිෂ් පෙට්‍රෝලියම්, ෂෙල් වැනි සංගත හා අනෙකුත් බහුජාතික සමාගම්වල ඳඬු අඬුවෙන් මිදීම සඳහා ඒවා, සැලසුම්ගත සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීමේ කොටසක් ලෙස පිහිටුවන, මහජන අයිතියට හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට යටත් ව්‍යවසායන් බවට පත්කල යුතුය.

එක්සත් ජනපදයේ අවිවල බලයෙන් බොහෝකොට ම බලයේ රැඳී සිටින, සවුදි රජ පවුල හා අනෙක් ප්‍රභූ පැලැන්ති අතෙහි දැනට පවතින මැද පෙරදිග තෙල් නිපදවන රටවල දැවැන්ත බලශක්ති සම්පත් එම රටවල වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතට පත්කල යුතුය. මේ ආකාරයෙන්, බලශක්ති ගවේෂනය, සංවර්ධනය හා සැපයුම සඳහා, කම්කරු පන්තිය විසින් ප්‍රසිද්ධියේ විවාද කල හා ප්‍රජාතන්ත්‍රවාදීව අනුමත කල බුද්ධිමත් ජාත්‍යන්තර සැලැස්මකින් මඟ පෙන්විය හැකිය. ලෝක ජනතාවගේ ම ඕනෑ එපාකම් ඉටුකල හැකි ආකාරයේ සමානවූ ද, සාධාරනවූ ද පදනමක එය තබනු ඇත.

ඒ සමඟ ම දැවැන්ත සම්පත්, අඩු වියදම්, වැඩි දියුනුකල හැකි හා පරිසර හිතකාමී බලශක්ති සංවර්ධනය සඳහා යෙදවිය යුතුය.

එක්සත් ජනපද බලශක්ති ඒකාධිකාරයන් ද, මෝටර් රථ කර්මාන්තය හා ආන්ඩු විසින් වැලැක්වීමට උත්සාහ දරන ලද විශ්වසනීය පොදු ප්‍රවාහන සේවා සංවර්ධනයට පිලිතුර විය යුත්තේ නාගරික පොදු ප්‍රවාහන ජාලයන් මෙන්ම ඉන්ධන පිරිමැසුම්දායක වාහන සංවර්ධනය සඳහා ඩොලර් බිලියන සිය ගනන් යෙදවීමයි. මෙය තීරනාත්මක වන්නේ එක්සත් ජනපදයට පමනක් නොවේ. පාරිසරික ව්‍යසනයක් නිර්මානය කිරීමට තර්ජනය කරන කාබනික ඉන්ධන භාවිතාකරන වාහන පාවිච්චිය වේගයෙන් වැඩිවන චීනය හා ඉන්දියාවට ද මෙය තීරනාත්මකය.

මනුෂ්‍ය වර්ගයා මුහුනදෙන ගැටලු ප්‍රධානකොටම ඇතිව තිබෙන්නේ සම්පත් හිඟකම නිසා නොව ධනේශ්වර පද්ධතියේ අවිධිමත් ස්වභාවයෙනි. මානව ශ්‍රමයේ දැවැන්ත ප්‍රමානයන් නැති භංග කරමින් හා දැනටමත් විශ්මයජනක ලෙස ධනවත් ප්‍රභූතන්ත්‍රයන් තවත් ධනවත් කිරීමේ ශක්‍යතාවය ඇතිකිරීම සඳහා කටයුතු කිරීමෙනි. ලෝකයේ නිෂ්පාදන හා ස්වාභාවික සම්පත් ධනේශ්වර පුද්ගලික හිමිකමේ හා ජාතික රාජ්‍ය පද්ධතියේ බන්ධනයෙන් මුදාගත යුතු අතර 21 වන සියවසේ අභියෝග ජයගැනීමට, විද්‍යාත්මකව සැලසුම් කල බුද්ධිමත් හා ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයකට මෙහෙය විය යුතුය.

මේ සඳහා සටන්වැදීමේදී සාමාන්‍ය මහජනතාව නොව ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රභූව නියෝජනය කරන සෑම රටකම ආන්ඩුවලට එරෙහිව අරගලයක් අවශ්‍ය කෙරේ. එක්සත් ජනපදයේදී මෙහි අර්ථය ඩිමොක්‍රටික් පක්ෂයෙන් කැඩී වෙන්වෙමින් කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂයක්, ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත ගොඩ නැගීමයි.

එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය හා එහි සහෝදර පක්ෂ ලොව පුරා සටන්වදින ඉදිරිදර්ශනය මෙයයි.

© www.wsws.org